සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)**
**General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)**

| | | |
|---|---|---|
| **සාමාන්‍ය පොදු පරීක්ෂණය**<br>பொதுச் சாதாரணப் பரீட்சை<br>Common General Test | **12 S** | **පැය දෙකයි**<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත් ව කියවන්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරා ගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** වර්ෂ 48 000කට පූර්ව යුගයකදී, අප්‍රිකාවෙන් බැහැර ස්ථානයකදී පූර්වයෙන්ම භාවිත කරන ලදැයි හඳුනාගෙන ඇති දුනු-ඊතල තාක්ෂණයට අයත් පෞරාණික වස්තු සමූහයක් පුරාවිද්‍යාඥයින් විසින් ශ්‍රී ලංකාවේ ලෙනකින් සොයාගනු ලැබ ඇත. මෙම ලෙන කුමක් ද?
(1) ලාහුගල ලෙන (2) පාහියන්ගල ලෙන (3) පන්නිල ලෙන
(4) රාවණා ඇල්ල ලෙන (5) රොටුපිහිල්ල ලෙන

**2.** මන්නාරමෙහි පිහිටි තම්බපවනි බලාගාරය 2020 දෙසැම්බර් මාසයේදී ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කරන ලදී. මෙය
(1) ගල් අඟුරු විදුලි බලාගාරයකි. (2) ඩීසල් විදුලි බලාගාරයකි.
(3) ජල විදුලි බලාගාරයකි. (4) සූර්ය විදුලි බලාගාරයකි.
(5) සුළං විදුලි බලාගාරයකි.

**3.** ශ්‍රී ලංකාවේ සමහර ප්‍රදේශවල බඩ ඉරිඟු වගාව, අවුරුදු දෙකකට පමණ පෙර, 'සේනා' නමින් මෙරටදී හඳුන්වනු ලැබූ දළඹුවන් වර්ගයකගේ ප්‍රහාරයට ලක් විය. මෙම දළඹුවන් සඳහා භාවිත වූ අනෙක් නම කුමක් ද?
(1) ෆෝල් ආමි වර්ම් (The Fall Army Worm)
(2) රයිස් ආමි වර්ම් (Rice Army Worm)
(3) බීට් ආමි වර්ම් (Beet Army Worm)
(4) සදර්න් ආමි වර්ම් (Southern Army Worm)
(5) ට්‍රෲ ආමි වර්ම් (True Army Worm)

**4.** 2021 ජූනි මාසයේදී පැවති 2019-2021 ICC ලෝක ටෙස්ට් ක්‍රිකට් ශූරතා තරගාවලියේ අවසාන තරගය සඳහා ක්‍රීඩා කළේ පහත සඳහන් කුමන රටවල් දෙක ද?
(1) ඔස්ට්‍රේලියාව සහ ඉන්දියාව (2) එංගලන්තය සහ නවසීලන්තය
(3) එංගලන්තය සහ ඉන්දියාව (4) එංගලන්තය සහ ඔස්ට්‍රේලියාව
(5) නවසීලන්තය සහ ඉන්දියාව

**5.** වර්ෂ 2021 දී, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින්, අන්තරායකර සංයෝගයක් අඩංගු වී තිබීමේ හැකියාව සලකමින්, දේශීය වෙළෙඳපළෙහි අලෙවි වූ පොල්තෙල්වල ගුණාත්මකභාවය පරීක්ෂා කරන ලදී. මෙම සංයෝගයෙහි නම කුමක් ද?
(1) ඇසිටෝන් (2) ඇසිටමයිඩ් (3) ඇසිටේට් (4) ඇෆ්ලටොක්සින් (5) ඇලුමිනියම්

**6.** කන්‍යා ඩි. අල්මේදා (Kanya D' Almeida) 2021 දී එක්තරා ජාත්‍යන්තර සාහිත්‍ය සම්මානයක් දිනාගත් ප්‍රථම ශ්‍රී ලාංකිකයා බවට පත්විය. එම සම්මානයෙහි නම කුමක් ද?
(1) පොදුරාජ්‍ය මණ්ඩලීය පොත් ත්‍යාගය (2) පොදුරාජ්‍ය මණ්ඩලීය රචකයින්ගේ ත්‍යාගය
(3) පොදුරාජ්‍ය මණ්ඩලීය කෙටිකතා ත්‍යාගය (4) ලන්ඩන් මැගසින් කෙටිකතා තරගය
(5) ජාත්‍යන්තර බුකර් ත්‍යාගය

**7.** කොරෝනා වෛරස රෝගය - 2019 (COVID - 19) ට එරෙහිව භාවිත **නොකරන** ලද්දේ පහත දැක්වෙන කුමන එන්නත ද?
(1) ඇන්ත්‍රැක්ස් (2) කොවැක්සින් (3) මොඩර්නා
(4) ඔක්ස්ෆර්ඩ් - ඇස්ට්‍රාසෙනිකා (5) ෆයිසර්-බයෝඇන්ඩ්ටෙක්

[දෙවැනි පිටුව බලන්න.

**8.** 2021 මැයි මාසයේදී, රසායන ද්‍රව්‍ය රැගත් භාණ්ඩ ප්‍රවාහන නෞකාවක් පරිසර විනාශයක් සිදුකරමින් ශ්‍රී ලංකා වෙරළට ඔබ්බෙන් මුහුදේදී ගිනිගත්තේ ය. මෙම නැවෙහි නම කුමක් ද?
(1) MV සී ස්ටාර් (2) MT නිව් ඩයමන්ඩ් (3) MV කන්සෙප්ෂන්
(4) MV කළම්බු එක්ස්ප්‍රස් (5) එක්ස්-ප්‍රස් පර්ල්

**9.** නිවසේදී සිදු කරනු ලබන පහත සඳහන් කවර කාර්යය පරිසරයට හානිකර වේ ද?
(1) මාංශමය ආහාර අඩුවෙන් අනුභවය (2) සමහර ශාක වැවීම (3) බැටරි භාවිතය
(4) සූර්ය බලශක්තිය භාවිතය (5) LED විදුලි බුබුළු භාවිතය

**10.** 2021 ජූලි 11 වන දින රිචඩ් බ්‍රැන්සන් (Richard Branson) ඇතුළු මගී කණ්ඩායමක් අර්ධ කක්ෂීය උඩුගුවන වෙත රැගෙන ගිය අභ්‍යවකාශ යානයෙහි නම කුමක් ද?
(1) ෂෙන්ෂවු - 12 (2) නිව් ෂෙපර්ඩ් (3) ස්පේස් ෂිප් ටූ
(4) වර්ජින් ගැලැක්ටික් යුනිටි - 22 (5) ස්පේස්එක්ස් කෲ - 2

**11.** එකම භාණ්ඩය නිෂ්පාදනය කෙරෙන A සහ B නම් යන්ත්‍ර දෙකක් කර්මාන්තශාලාවක ඇත. A යන්ත්‍රය භාණ්ඩ 32 ක් නිපදවීමට පැය 6 ක් ද, B යන්ත්‍රය භාණ්ඩ 40 ක් නිපදවීමට පැය 5 ක් ද ගනියි. භාණ්ඩ 220 ක් නිපදවීම සඳහා යන්ත්‍ර දෙකම එකවර පණ ගන්වනු ලැබේ. ඒවා කොපමණ වේලාවක් ගනු ඇති ද?
(1) පැය 08 මිනිත්තු 15 (2) පැය 14 මිනිත්තු 30
(3) පැය 16 මිනිත්තු 15 (4) පැය 16 මිනිත්තු 20
(5) පැය 16 මිනිත්තු 30

**12.** මිනිස්සු දෙදෙනෙක් දුම්රිය මාර්ගයකට සමාන්තරව එකම දිශාවට $2\ \text{km h}^{-1}$ සහ $3\ \text{km h}^{-1}$ වේගවලින් ගමන් කරමින් සිටිති. එම දිශාවට ම ගමන් කරන දුම්රිය එන්ජිමක් පිළිවෙළින් තත්පර 9 කදී සහ තත්පර 12 කදී ඔවුන්ව සම්පූර්ණයෙන් පසුකරයි. දුම්රිය එන්ජිමේ දිග කොපමණ ද?
(1) 10 m (2) 12 m (3) 15 m (4) 16 m (5) 18 m

**13.** සිල්වා මහතා එකම දිනයේදී රු. 150 000 ක මුළු මුදලක් *A* සහ *B* බැංකු දෙකෙහි පිළිවෙළින් 8% ක සහ 10% ක වාර්ෂික සුළු පොළී අනුපාතික යටතේ තැන්පත් කරයි. අවුරුදු දෙකක කාලයකට පසු, ඔහුගේ තැන්පතු දෙක සඳහා සුළු පොළිය වශයෙන් ඔහු රු. 27 200 ක මුළු මුදලක් උපයා ගනියි. ඔහු ආරම්භයේදී *B* බැංකුවේ තැන්පත් කළ මුදල කොපමණ ද?
(1) රු. 70 000 (2) රු. 75 000 (3) රු. 78 000 (4) රු. 80 000 (5) රු. 82 000

**14.** පෙරේරා මහත්මිය තොග වෙළෙඳපොළෙන් එක් බිලවුසයක් රු. 375 බැගින් බිලවුස 120 ක් මිලට ගත්තා ය. ඒවා ඇයගේ ගබඩාවට ප්‍රවාහනය කිරීමට රු. 1 200 ක් වැය විය. තවද ඒවා මැදීම සඳහා එක් බිලවුසයකට රු. 25 ක් බැගින් ද, අලෙවියට පෙර ඇසුරුම සඳහා රු. 2 400 ක මුළු මුදලක් ද වැය කිරීමට ඇයට සිදුවිය. දැන් ඇය එක් එක් බිලවුසයෙන් 30% ක ලාභයක් සහිතව ඒවා විකිණීමට සැලසුම් කරයි. එක් බිලවුසයක විකුණුම් මිල කොපමණ විය යුතු ද?
(1) රු. 515 (2) රු. 559 (3) රු. 560 (4) රු. 585 (5) රු. 595

**15.** තමා $60\ \text{km h}^{-1}$ වේගයෙන් යන්නේ නම් දහවල් 12.00 ට *X* ස්ථානයට ළඟා විය හැකි බව ද $75\ \text{km h}^{-1}$ වේගයෙන් යන්නේ නම් පෙ.ව. 11.30 ට එම ස්ථානයට ළඟා විය හැකි බව ද බන්දුල සිය ගමන පිටත්වීමට පෙර නිමානය කරයි. අවසානයේ ඔහු පෙ.ව. 11.35 ට *X* නම් ස්ථානය වෙත ළඟා විණි නම්, ඔහුගේ මධ්‍යක වේගය කොපමණ ද?
(1) $70\ \text{km h}^{-1}$ (2) $71\ \text{km h}^{-1}$ (3) $72\ \text{km h}^{-1}$ (4) $73\ \text{km h}^{-1}$ (5) $74\ \text{km h}^{-1}$

**16.** බීම වර්ගයක් සෑදීම සඳහා A වර්ගයේ යුෂ, B වර්ගයේ යුෂ සමග 4 : 3 අනුපාතයට භාජනයක මිශ්‍ර කරනු ලැබේ. මෙම භාජනයෙන් බීම ලීටර 7 ක් පානය කිරීම සඳහා ගත් පසු B වර්ගයේ යුෂ ලීටර 7 ක් භාජනයට එක් කරනු ලබන්නේ භාජනයේ ඇති A වර්ගයේ යුෂ සහ B වර්ගයේ යුෂ අතර අනුපාතය 4 : 5 වන පරිදි ය. ආරම්භයේදී A වර්ගයේ යුෂ ලීටර කීයක් යොදාගනු ලැබිණි ද?
(1) ලීටර 12 (2) ලීටර 15 (3) ලීටර 18 (4) ලීටර් 22 (5) ලීටර් 36

**17.** අසිත, සිසුන් 45 ක් සිටින ඔහුගේ පන්තියේ ගණිත පරීක්ෂණයේ මධ්‍යක ලකුණ 52 බවට ගණනය කළේ ය. එහෙත් මධ්‍යක ලකුණ ගණනය කිරීම සඳහා අසිත යොදාගත් ලකුණු අතර 81, 72 සහ 63 යන නිවැරදි ලකුණු තුන වෙනුවට 18, 27 සහ 36 ලෙස පිළිවෙළින් සාවද්‍ය ලකුණු තුනක් සටහන් කර ඇති බව ගුරුවරයා අනාවරණය කර ගත්තේ ය. ගණිත පරීක්ෂණයේ නිවැරදි මධ්‍යක ලකුණ කීය ද?
(1) 54 (2) 55 (3) 56 (4) 57 (5) 59

**18.** මිනින්දෝරුවෙක් සමචතුරස්‍ර බිම්කඩක පැත්තක දිග මැනීමේදී නිවැරදි අගයෙන් 3% ක් වැඩි වන ලෙස දෝෂ සහගත මිනුමක් ලබා ගත්තේ ය. අනතුරුව එම අගය භාවිත කරමින් ඔහු සමචතුරස්‍ර බිම්කඩෙහි වර්ගඵලය ගණනය කළේ ය. වර්ගඵලය ගණනය කිරීමේ ප්‍රතිශත දෝෂය කුමක් ද?
(1) 1.06 % (2) 3.09 % (3) 4.09 % (4) 5.09% (5) 6.09 %

[තුන්වැනි පිටුව බලන්න.

**19.** ඔරලෝසුවක් වේලාව වැඩියෙන් දක්වමින් ඒකාකාර වේගයෙන් ක්‍රියාකරයි. එහි වේලාව, එක් ඉරිදාවක පෙ.ව. 11.00 ට, මිනිත්තු 3 ක් පසුපසින් තිබූ අතර, ඊළඟ ඉරිදා ප.ව. 6.00 ට, මිනිත්තු 5 යි තත්පර 45 ක් ඉදිරියෙන් විය. මෙම කාලය තුළ ඔරලෝසුව නිවැරදි වේලාව පෙන්වූයේ කුමන අවස්ථාවේදී ද?

(1) අඟහරුවාදා පෙ.ව. 11.00
(2) අඟහරුවාදා ප.ව. 10.00
(3) අඟහරුවාදා ප.ව. 11.00
(4) අඟහරුවාදා ප.ව. 11.30
(5) බදාදා ප.ව. 11.00

**20.** අවුරුදු හතරකට පෙර ප්‍රනාන්දු මහතාගේත් එම මහත්මියගේත් ඔවුන්ගේ දියණියගේත් මධ්‍යක වයස අවුරුදු 25 ක් වූ අතර, අවුරුදු හයකට පෙර ප්‍රනාන්දු මහත්මියගේත් දියණියගේත් මධ්‍යක වයස අවුරුදු 22 ක් විය. ප්‍රනාන්දු මහතාගේ දැන් වයස කොපමණ ද?

(1) අවුරුදු 29 (2) අවුරුදු 30 (3) අවුරුදු 31 (4) අවුරුදු 32 (5) අවුරුදු 35

**21.** දෘඪතාව, ස්‍යන්දනය (ගලායාමේ ස්වභාවය) සහ උණුසුම් බව යන ගුණාංග තුන අතුරෙන් වැඩිම ගුණාංග සංඛ්‍යාවක් ඇත්තේ පහත දී ඇති කවරක ද?

(1) ලාවා (2) හුමාලය (3) දුම (4) සිමෙන්ති (5) ගින්දර


**22.** අක්මල් අවුරුදු පහකට පෙර වානේ තලයකින් සහ ලී මිටකින් සමන්විත පොරවක් මිලට ගත්තේ ය. ඔහු සෑම මාස අටකට වරක් එහි තලය ද සෑම අවුරුදු දෙකකට වරක් එහි මිට ද මාරු කළේ ය. පොරව මුලින්ම මිලදී ගැනීමෙන් පසු කී වරක් ඔහු අලුත් ම පොරවක හිමිකරුවකු වීමේ වරප්‍රසාදය භුක්ති වින්දේ ද?

(1) එක් වරක්
(2) දෙවරක්
(3) තෙවරක්
(4) සිවුවරක්
(5) කිසිවිටෙක නැත


**23.** ළිං පතුලක වෙසෙන ගෙම්බෙක් සහ මැඩියෙක් එකම මොහොතක ළිං ඉවුර (බිත්තිය) දිගේ ඉහළ නැඟීමට පටන් ගනිති. සෑම අනුයාත මිනිත්තුවක කාල ප්‍රාන්තරය තුළදී ම ගෙම්බා එකී මිනිත්තුව ආරම්භයේදී ළිං ගැට්ටේ සිට තමන්ට ඇති දුරෙන් හරි අඩක් ඉහළට නගියි. මැඩියා ද මෙසේ ඉහළට නගින අතර, අනුයාත මිනිත්තුව තුළ පසු කර යන දුර, ළිං ගැට්ටේ සිට තමන්ට ඇති දුරෙන් තුනෙන් පංගුවකි. ගමන ඇරඹූ මොහොත් සිට මිනිත්තු දෙකක් ඉක්ම ගිය පසු මොවුන් දෙදෙනා අතර පරතරය 7 m ක් වේ නම්, ළිඳ කොපමණ ගැඹුරුවේ ද?

(1) 32 m (2) 34 m (3) 36 m (4) 40 m (5) 64 m

**24.**




රූපයෙහි පෙන්වා ඇති ඔරලෝසු මුහුණතෙහි නිවැරදි දර්පණ ප්‍රතිබිම්බය දෙනු ලබන්නේ පහත දැක්වෙන කවර රූපයෙන් ද?




(1) (2) (3) (4) (5)

**25.** පහත දී ඇති එක් එක් රූපයෙන්, ඝනකයක අනාවෘත මුහුණත්වල ඇඳ ඇති රූප දැක්වේ.




ඉහත දී ඇති ඝනකය සෑදීම සඳහා පහත දැක්වෙන කවර පතරොම භාවිත කළ හැකි ද?



(1) (2) (3) (4) (5)

- අංක **26** සහ **27** ප්‍රශ්න, අවුරුදු පහක කාලයක් තුළ එක් එක් වර්ෂයේදී පිළිවෙළින් $A, B, C, D$ සහ $E$ නම් සමාගම් පහක අලෙවිය දැක්වෙන පහත දී ඇති ප්‍රස්තාරය මත පදනම් වේ.




**26.** මෙම කාලය තුළ ඉහළ ම අලෙවි වර්ධන වේගය ඇත්තේ කුමන සමාගමට ද?

(1) $A$ (2) $B$ (3) $C$ (4) $D$ (5) $E$

**27.** මෙම කාලය තුළ අලෙවියෙහි වැඩි ම ස්ථාවර බව පෙන්වන්නේ කුමන සමාගම ද?

(1) $A$ (2) $B$ (3) $C$ (4) $D$ (5) $E$

- අංක **28** සහ **29** ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති ප්‍රකාශ හතර $(A)$ නිශ්චිතවම සිදුවන, $(B)$ සිදුවීමට හැකි, $(C)$ සිදුවීමේ ඉඩ බෙහෙවින් අඩු සහ $(D)$ කිසිසේත් සිදු නොවන ලෙස වර්ග කළ යුතු වේ.

**28.**
1. පුද්ගලයින් 14 දෙනකුගෙන් යුත් කණ්ඩායමක, එකම මාසයේ උපන් දෙදෙනෙක් සිටිති.
2. ඕනෑම සරල රේඛා තුනක් එකම ලක්ෂ්‍යයකදී හමු වේ.
3. නොනැඹුරු කාසියක් 100 වරක් උඩ දැමූ විට 99 වාරයක් ම ප්‍රතිඵලය සිරස වේ.
4. $x^2 = 1$ වන විට $x = 1$ වේ.

ඉහත ප්‍රකාශ හතර අනුපිළිවෙළින් වර්ග කළ හැකි වන්නේ,

(1) C, D, D, A ලෙස ය. (2) B, B, D, A ලෙස ය. (3) B, A, D, B ලෙස ය.
(4) A, D, C, B ලෙස ය. (5) A, B, D, A ලෙස ය.

**29.**
1. තම දරුවන් හයදෙනාම දූවරුන් වන මවක්, තවත් ගැහැනු දරුවකු බිහි කරයි.
2. ඕනෑම සරල රේඛා තුනක් එකම ලක්ෂ්‍යයකදී හමුවේ නම්, එවිට ඕනෑම සරල රේඛා හතරකුත් එකම ලක්ෂ්‍යයකදී හමු වේ.
3. නොනැඹුරු කාසියක් 10 වරක් උඩ දැමූ විට, 5 වාරයක් ම ප්‍රතිඵලය සිරස වේ.
4. සියලුම පක්ෂීන්ට පියාඹීමට හැකි වේ.

ඉහත ප්‍රකාශ හතර අනුපිළිවෙළින් වර්ග කළ හැකි වන්නේ,

(1) B, A, A, B ලෙස ය. (2) B, A, B, D ලෙස ය. (3) C, B, B, C ලෙස ය.
(4) C, B, C, D ලෙස ය. (5) C, D, A, B ලෙස ය.

- අංක **30** සිට **32** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

පාසල් වත්තේ පලතුරු ගස්වලට පොලු ගසා අඹ ගෙඩි හතක් සහ දොඩම් ගෙඩි පහක් බිම හෙළීමේ වරදට හසු වූ ශිෂ්‍යයින් පස්දෙනකු කැඳවා, එක් එක් ශිෂ්‍යයා කැඩූ පලතුරු ගෙඩි ගණන පිළිබඳ ව ප්‍රශ්න කළ විට ඔවුන් ලබාදුන් පිළිතුරු පහත දැක්වේ.

අමල් – අඹ ගෙඩියක් සහ දොඩම් ගෙඩියක් විතරයි.
හවන් – අඹ ගෙඩි දෙකක් සහ දොඩම් ගෙඩියක් විතරයි.
කාසිම් – අඹ ගෙඩි දෙකක් විතරයි.
ඩේවිඩ් – අඹ ගෙඩියක් සහ දොඩම් ගෙඩි දෙකක් විතරයි.
එමිල් – දොඩම් ගෙඩියක් විතරයි.

**30.** එක් අයකු පමණක් බොරු කියන්නේ නම් සහ ඔහු සත්‍ය වශයෙන්ම අඹ ගෙඩියක් සහ දොඩම් ගෙඩියක් පමණක් කඩා ඇත්නම්, ඒ කවුරු විය හැකි ද?

(1) අමල් (2) හවන් (3) කාසිම් (4) ඩේවිඩ් (5) එමිල්

**31.** එක් අයකු පමණක් බොරු කියන්නේ නම් සහ ඔහු සත්‍ය වශයෙන්ම අඹ ගෙඩි තුනක් සහ දොඩම් ගෙඩියක් පමණක් කඩා ඇත්නම්, ඒ කවුරු විය හැකි ද?

(1) අමල් (2) හවන් (3) කාසිම් (4) ඩේවිඩ් (5) එමිල්

**32.** ඇත්ත කියන්නන් විසින් කඩන ලද අඹ ගෙඩි ගණන හතරක් ද, බොරු කියන්නන් විසින් කඩන ලද දොඩම් ගෙඩි ගණන දෙකක් ද නම්, අමල් සත්‍ය වශයෙන්ම කඩා ඇත්තේ මොනවා ද?

(1) අඹ ගෙඩි දෙකක් පමණි.
(2) දොඩම් ගෙඩියක් පමණි.
(3) අඹ ගෙඩියක් සහ දොඩම් ගෙඩියක් පමණි.
(4) අඹ ගෙඩියක් සහ දොඩම් ගෙඩි දෙකක් පමණි.
(5) අඹ ගෙඩි තුනක් සහ දොඩම් ගෙඩියක් පමණි.

- අංක **33** සිට **35** තෙක් ප්‍රශ්න, බීජිප්තුව සහ සීජිප්තුව නම් ප්‍රබන්ධමය රාජධානි දෙකක් මත පදනම් වේ. ඉන් එක් රාජධානියක සංඛ්‍යා ලියන ලද්දේ 2 පාදයෙන් වන අතර, අනෙක් රාජධානියේ ලියන ලද්දේ 3 පාදයෙනි. තව ද ඔවුහු තමන්ගේම සංඛ්‍යාංක මාලාවක් භාවිත කළහ. බීජිප්තු වැසියන් ~@~ ලෙස ලියූ සංඛ්‍යාව සීජිප්තු වැසියන් ලියූවේ &# ලෙස ය.

**33.** බීජිප්තු වැසියන් ~~~ ලෙස ලියූ සංඛ්‍යාව, සීජිප්තු වැසියන් ලියූවේ කෙසේ ද?

(1) &# (2) #& (3) $& (4) ### (5) &&&

**34.** සීජිප්තු වැසියන් ## ලෙස ලියූ සංඛ්‍යාව, බීජිප්තු වැසියන් ලියූවේ කෙසේ ද?

(1) ~@@ (2) ~~@ (3) @~~ (4) ~@@@ (5) ~@~@

**35.** සීජිප්තු වැසියන් &$ ලෙස ලියූ සංඛ්‍යාව, බීජිප්තු වැසියන් ලියූවේ කෙසේ ද?

(1) ~~ (2) ~~@ (3) $~~ (4) ~@* (5) ~@~

- අංක **36** සිට **38** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

මධ්‍ය මහා විද්‍යාලයකින් අ.පො.ස.(උසස් පෙළ) - 2020 විභාගයට පෙනී සිටි ශිෂ්‍යයන් අතුරෙන් සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ඉහළ ම ලකුණු ලැබූ හත්දෙනා ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබීම සඳහා තෝරා ගැනිණි. ඉහළ ම ලකුණු ලැබූ මෙම හත්දෙනාගේ කණ්ඩායම, භෞතීය විද්‍යා ශිෂ්‍යයන් දෙදෙනකුගෙන්, ජෛවීය විද්‍යා ශිෂ්‍යයකුගෙන්, තාක්ෂණවේදය ශිෂ්‍යයන් දෙදෙනකුගෙන්, වාණිජ්‍ය ශිෂ්‍යයකුගෙන් සහ කලා ශිෂ්‍යයකුගෙන් සමන්විත විය. ඔවුන්ගෙන් කිසිදු දෙදෙනකුගේ සාමාන්‍ය පොදු පරීක්ෂණයේ ලකුණු සමාන නොවීය.

* තාක්ෂණවේදය ශිෂ්‍යයන්ට පළමුවෙනි ස්ථානය හෝ පස්වෙනි ස්ථානය හෝ හිමි නොවීය.
* වාණිජ්‍ය ශිෂ්‍යයාට දෙවෙනි ස්ථානය හෝ හයවෙනි ස්ථානය හෝ හිමි නොවීය.
* ඉහළ ලකුණු ලැබූ තාක්ෂණවේදය ශිෂ්‍යයාගේ ස්ථානයත්, වාණිජ්‍ය ශිෂ්‍යයාගේ ස්ථානයත් අතර සිටියේ එක් ශිෂ්‍යයකු පමණි.
* කලා ශිෂ්‍යයාගේ ස්ථානය, පහළ ලකුණු ලැබූ තාක්ෂණවේදය ශිෂ්‍යයාගේ ස්ථානයට පසුව එන ඊළඟ ස්ථානය විය.
* ජෛවීය විද්‍යා ශිෂ්‍යයාගේ ස්ථානය, ඉහළ ලකුණු ලැබූ භෞතීය විද්‍යා ශිෂ්‍යයාගේ ස්ථානයට පසුව එන ඊළඟ ස්ථානය විය.

**36.** අ.පො.ස.(උසස් පෙළ) - 2020 විභාගයේ සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා මෙම විද්‍යාලයෙන් ඉහළම ලකුණු ලබාගත් ශිෂ්‍යයා කුමන විෂය ධාරාවේ ද?

(1) භෞතීය විද්‍යා (2) ජෛවීය විද්‍යා (3) තාක්ෂණවේදය
(4) වාණිජ්‍ය (5) කලා

**37.** හත්වන ස්ථානය හිමිකර ගත් ශිෂ්‍යයා කුමන විෂය ධාරාවේ ද?

(1) භෞතීය විද්‍යා (2) ජෛවීය විද්‍යා (3) තාක්ෂණවේදය
(4) වාණිජ්‍ය (5) කලා

**38.** තාක්ෂණවේදය ශිෂ්‍යයන් දෙදෙනා හිමිකර ගෙන තිබුණේ කුමන ස්ථාන ද?

(1) 2 සහ 3 (2) 2 සහ 4 (3) 2 සහ 6 (4) 3 සහ 6 (5) 4 සහ 6

**39.** පහත දැක්වෙන නිගමනය දුර්වල කරන ප්‍රබලතම සාක්ෂිය (සත්‍ය වේ නම්) තෝරන්න.

"අද කාලයේ කවර නැවක වුව සෑම පැයකදී ම එහි පිහිටීම වාර්තා කරන පටිගතකරණයක් ඇත."

(1) නවීන නෞකාවක් වන ෆ්ලෙක්ස්ප්‍රස්-වර්ල්හි (Flex-Press-Whirl) සියලුම පටිගතකරණ භාවිත කරනු ලැබුවේ මුහුදු තරංගවල ශබ්දය පටිගත කිරීමට පමණි.
(2) එක් එක් පැය අනුව නැවේ පිහිටීම වාර්තා ගත කළ යුත්තේ කවර දිනවලදී දැයි තීරණය කිරීමට නැවක කපිතාන්ට හැකි වේ.
(3) එක් එක් පැය අනුව නැවේ පිහිටීම වාර්තා කිරීම සඳහා සෑම මුහුදු ගමනකදීම යාත්‍රිකයකු පත් කිරීමට කොලොම්බස් කටයුතු කළේ ය.
(4) ඕනෑම නැවක පිහිටීම අන්වේෂණය කිරීමට ගූගල්වලට (Google) හැකි බැවින්, නැව විසින් එහි පිහිටීම වාර්තාගත කිරීම අවශ්‍ය නොවේ.
(5) මෑතකදී ගිලුණු එවර් රේස් (Ever-Race) නම් නැවෙන් සොයාගනු ලැබූ වාර්තාවල පටිගත වී තිබුණේ නැවේ දෛනික පිහිටීම් පමණි.

**40.** ඡායාරූප මුද්‍රණ යන්ත්‍රයක් රතු, නිල් සහ කහ යන මූලික වර්ණ තුන පමණක් භාවිත කරයි. කිසියම් දෝෂයක් නිසා කහ සහ නිල් වර්ණ අතුරු මාරු වී තිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වර්ණ විකෘති වූ පිටපත් මුද්‍රණය වී තිබුණි. මෙම මුද්‍රණ යන්ත්‍රයෙන් මුද්‍රණය කළ විට අවම වර්ණ විකෘතියක් සිදුවන්නේ පහත දැක්වෙන කවරක ඡායාරූපයෙහි ද?

(1) තණකොළපෙත්තෙක් (2) බතල අලයක් (3) සඳ
(4) කැරට් අලයක් (5) දේදුන්නක්

● අංක **41** සහ **42** ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

වෘත්තීය පුහුණු පාඨමාලාවකට බඳවාගැනීම සඳහා පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. 2022 ජනවාරි 01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 22 ට නොවැඩි වීම.
2. අවම වශයෙන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT), ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ සහිතව එක වරකදී අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයක් සමත් වීම.

**සටහන :**

(i) ICT සඳහා සම්මාන සාමාර්ථයක් ලබා නොමැති අයදුම්කරුවන් සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගයෙන් සම්මාන සාමාර්ථයක් ලබා ඇත්නම් ආයතනයේ අධ්‍යයන සභාවෙහි එකඟතාව මත සලකා බැලේ.

(ii) ඉංග්‍රීසි සඳහා සම්මාන සාමාර්ථයක් ලබා නොමැති අයදුම්කරුවන් ඉංග්‍රීසි භාෂාවෙන් සුදුසුකම් සැපිරීමේ පරීක්ෂණයකට පෙනී සිට එයින් ලකුණු 50 කට වැඩියෙන් ලබාගැනීමේ එකඟතාව මත සලකා බැලේ.

එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති තොරතුරු අනුව,

අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇත්නම් ........................................................ *a* ද,
අයදුම්කරු සුදුසුකම් සපුරා නැත්නම් ............................................................... *b* ද,
අයදුම්කරුට සුදුසුකම් සැපිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට සිදුවේ නම් .............. *c* ද,
අයදුම්කරුට අධ්‍යයන සභාවෙහි එකඟතාව ලබාගැනීමට සිදු වේ නම් ................. *d* ද,
නිගමනයකට එළඹීම සඳහා සපයා ඇති තොරතුරු ප්‍රමාණවත් නොවේ නම් .......... *e* ද, තෝරන්න.

**41.** 2000 ජනවාරි 01 දින ඉපදුණු, ශ්‍රී ලාංකිකයකු වන අරුල්, එක් වරක් පමණක් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට ඇති අතර, දෙමළ භාෂාව, ශෛවනරි, ඉතිහාසය, විද්‍යාව, ICT සහ කර්ණාටක සංගීතය සඳහා සම්මාන සාමාර්ථ ද ගණිතය සහ ඉංග්‍රීසි සඳහා සාමාන්‍ය සාමාර්ථ ද ලබා ඇත.


(1) *a* (2) *b* (3) *c* (4) *d* (5) *e*

**42.** 2003 දෙසැම්බර් 31 දින ඉපදුණු, ශ්‍රී ලාංකිකයකු වන සාවිත්‍රි, අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරකදී දෙමළ භාෂාව, ශෛවනරි, ඉතිහාසය, ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව, කර්ණාටක සංගීතය සහ කෘෂිකර්මය සඳහා සම්මාන සාමාර්ථ ලබා ඇත. ඇය සාමාන්‍ය තොරතුරු තාක්ෂණය විභාගයෙන් අධි සම්මාන සාමාර්ථයක් ද ලබා ඇත.

(1) *a* (2) *b* (3) *c* (4) *d* (5) *e*

● අංක **43** සහ **44** ප්‍රශ්න, පහත රූපයේ දී ඇති තොරතුරු මත පදනම් වේ.

පාසලක අ.පො.ස.(උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හදාරණ ශිෂ්‍ය සංඛ්‍යා රූප සටහනෙහි දැක්වේ. ඊට අමතරව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) විෂයය හදාරණ ශිෂ්‍ය සංඛ්‍යා ද එහි දැක්වේ.




**43.** තාක්ෂණවේදය විෂය ධාරාවේ සිසුහු කී දෙනෙක් ICT විෂයය හදාරත් ද?

(1) 20 (2) 30
(3) 40 (4) 50
(5) 60

**44.** තාක්ෂණවේදය විෂය ධාරාවේ සියලුම සිසුනට 'තාක්ෂණවේදය සඳහා විද්‍යාව' විෂයය හැදෑරීම අනිවාර්ය වේ. ඒ අනුව තාක්ෂණවේදය විෂය ධාරාවේ සිසුහු කී දෙනෙක් 'තාක්ෂණවේදය සඳහා විද්‍යාව' විෂයය හදාරත් ද?

(1) 60 (2) 90
(3) 110 (4) 160
(5) 180

**45.** මෙම ප්‍රශ්නයෙහි 1 සහ 7 මගින් දැක්වෙන වාක්‍ය අතර ඇති $A, B, C, D$ සහ $E$ වාක්‍ය නිවැරදි පටිපාටියට **නොමැත.** වාක්‍ය හතෙහි තර්කානුකූල අනුක්‍රමයක් ගොඩනැගීම සඳහා ඒවායේ වඩාත් ගැළපෙන පිළියෙල කිරීම තෝරන්න.

1 - කොස් ගසට වැඩීම සහ මේරීම පිණිස, වාතයට ජලයට සහ හිරු එළියට අමතරව පෝෂක ද අවශ්‍ය වේ.

*A* - පෝෂක, ස්වභාවයෙන්ම ලෝහ සහ අලෝහ යන දෙආකාරයෙන්ම වේ.

*B* - කොස් ගස, සිය මුල් ඔස්සේ ෆොස්ෆරස් සහ පොටෑසියම් යන දෙවර්ගයම අවශෝෂණය කරයි.

*C* - මුල්වලින් NPK ලබා ගැනෙන අතර, කාබොහයිඩ්රේට් ලෙස හැඳින්වෙන තවත් ප්‍රධාන සංරචකයක් පත්‍රවල ඇති ක්ලෝරොෆිල් (හරිතප්‍රද) වර්ණදේහ මගින් සංශ්ලේෂණය කරනු ලැබේ.

*D* - වාතයෙහි නයිට්‍රජන් අධික ලෙස අඩංගු වන නමුදු, කොස් ගස එහි නයිට්‍රජන් අවශ්‍යතාව ලබා ගන්නේ මුල්වලිනි.

*E* - පැළෑටිවලට අවශ්‍ය ප්‍රධාන ලෝහ සහ අලෝහ සංඝටක NPK ලෙස හැඳින්වේ.

7 - NPK ඇතුළු මුල්වලින් උරාගනු ලබන අනෙකුත් ඛනිජ ලවණ සහ කාබෝහයිඩ්‍රේට යන සියල්ල, කොස් ගසෙහි වැඩීමට සහ මේරීමට අවශ්‍ය සියලු තැනුම් ඒකක සංශ්ලේෂණය පිණිස යොදා ගැනේ.

(1) *A, D, E, B, C*
(2) *A, D, E, C, B*
(3) *A, E, D, B, C*
(4) *B, C, D, E, A*
(5) *D, B, C, A, E*

**46.** පහත දැක්වෙන $A, B, C, D$ සහ $E$ ඡේද පහෙන් එක එකක් වාක්‍ය තුනකින් සමන්විත වේ. අර්ථාන්විත අනුක්‍රමයක පිළියෙල කළ හැකි වාක්‍ය අඩංගු වනුයේ ඒවායින් කවර ඡේදයේ ද?

*A* (*a*) අවුරුද්දකට වර්ෂා කාල දෙකක් තිබේ.
(*b*) ඔක්තෝබර් සිට දෙසැම්බර් තෙක් කාලය තුළ අධික වර්ෂාව ලැබෙන අතර, මාර්තු සිට මැයි තෙක් කාලය තුළ මඳ වශයෙන් වර්ෂාව ලැබේ.
(*c*) වර්ෂාව අධික කාලය තුළ ජලාශ සහ අමුණු ජලයෙන් පිරී යයි.

*B* (*a*) දෙසැම්බර් සිට අප්‍රේල් දක්වා එක් වාරයක දී පමණක් තල්ගස්වල මල් හට ගැනේ.
(*b*) පෙබරවාරි සිට ජූනි තෙක් හා සැප්තැම්බර් සිට නොවැම්බර් තෙක් වන කාලය අතරතුර අවුරුද්දකට දෙවාරයක දී කජු ගස්වල මල් හට ගැනේ.
(*c*) පොල්ගස්වල අවුරුද්ද පුරා මල් හට ගැනේ.


*C* (*a*) රෝයි, ක්‍රීඩාවලට දක්ෂ වන අතර, පාසලේ සියලු දෙනා අතර ඉතා ජනප්‍රිය වෙයි.
(*b*) රම්‍යා පාසලේදී කථනයෙහි ද නාට්‍යවල ද ඉගෙනුම් කටයුතුවල ද දක්ෂ වෙයි.
(*c*) විදුහල්පති සහ විද්‍යාලයීය විනය මණ්ඩලය, රෝයි සහ රම්‍යා යන දෙදෙනාම පාසලේ ශිෂ්‍ය නායකයින් ලෙස පත් කරන්නැයි නිර්දේශ කළහ.

*D* (*a*) ලක්ෂ්මි ජල බඳුනක් උසුලාගෙන යද්දී සිහිසුන්ව ඇද වැටුණා ය.
(*b*) ලක්ෂ්මිට වරින්වර හිසරදයක් සෑදෙයි.
(*c*) ලක්ෂ්මි රෝහල් ගත කළ පසු ශල්‍යකර්මයකට භාජනය වූවා ය.

*E* (*a*) බැංකු, එක් සංඛ්‍යාංකයකින් දැක්වෙන මට්ටමේ ඉතා පහළ පොළී අනුපාතයක් යටතේ නිවාස ණය සපයයි.
(*b*) රජය විසින් බැංකුවල ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් තැන්පතු සඳහා පොළී අනුපාත එක් සංඛ්‍යාංකයක් තෙක් අඩු කරනු ලැබ ඇත.
(*c*) පොළී අනුපාත අඩු කිරීමේ අරමුණ, සියලුම පුරවැසියන්ට නිවාස ණය සැපයීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට ආධාර කිරීමයි.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*


**47.** පහත දැක්වෙන පින්තූර මගින් විස්තර කෙරෙන සිදුවීම සලකා බලන්න.




*A*




*B*




*C*



*D*



*E*



*F*

එම සිදුවීමෙහි නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන්නේ පහත සඳහන් කවර පිළිවෙල කිරීම මගින් ද?

(1) *D, E, C, F, B, A* (2) *D, E, C, A, B, F* (3) *D, C, E, A, F, B*
(4) *B, C, D, E, A, F* (5) *B, D, C, E, A, F*

● අංක **48** සිට **50** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන සංවාදය මත පදනම් වේ.

පාසලේ සිට ආපසු පැමිණීමෙන් අනතුරුව ළමයි තිදෙනෙක් සරුංගල් යැවීම සඳහා ඔවුන්ගේ මව සමඟ පිට්ටනියට යති. එහිදී ඔවුනට ළමුන්ගේ මාමා සෑම් හමුවෙයි.

පහත *A* සිට *L* තෙක් දැක්වෙන දෙබස්, ළමයින්, ඔවුන්ගේ මව සහ සෑම් මාමා අතර සංවාදය දක්වයි. ඔවුන් අතර සංවාදය නිවැරදි අනුක්‍රමයට පිළියෙල කර **නැත**.

*A* - සෑම් මාමා, රාජාලියා සරුංගලයක් යවන රාජ් ඔයාට පෙනෙනවා. ඔයා රාසු මල්ලිව දැක්කා ද?
*B* - ඔව්, පැය බාගෙකට කලින් මම එයාව නයා සරුංගලයක් එක්ක දැක්කා.
*C* - රාජ් අයියා, අපිට මේ අවට කොහේවත් නයා සරුංගලයක්වත් රාසුවත් පෙනෙන්නට නැහැ. ඒත් සෑම් මාමා මේ පැත්තට එනවා පේනවා.
*D* - ඒ වුණාට මේ පිට්ටනියේ සැහෙන හිස් ඉඩක් තියෙනවා. මිනිස්සු ගොඩකුත් මෙතැන ඉන්නවා. ඒ හින්දා අපට රාසුව ලේසියෙන් හොයාගන්න බැහැ.
*E* - සෑම් මාමා, ඔයාගේ කොරෝනා සරුංගලය නම් හරිම ඉහළයි. කවුද ඒක හැදුවේ?
*F* - මම එන පාරේ කොවිඩ් පරීක්ෂා කරන තැනක් තිබුණා.
*G* - රාසු මල්ලි කොහේ ගියා ද?
*H* - එයා, එයාගේ නයා සරුංගලය යවන්න ගිහිල්ලා.
*I* - හා හොඳයි. ඔයා බාල මල්ලි රණේවත් එක්කගෙන යන්න.
*J* - මමත් මාගේ රාජාලියා සරුංගලය අරින්න යනවා.
*K* - රාජ්, ඔයා ඉස්කෝලේ ඇරිලා එන්න පරක්කු වුණේ ඇයි?
*L* - මම ඒක තවත් කෙනෙකුගේ උදවුවෙන් හැදුවේ. එයා සරුංගලය විදුලියෙන් ආලෝකමත් කළා.

**48.** පහත දැක්වෙන කවරක, මව සහ වැඩිමහල් පුතා වන රාජ් අතර සංවාදයෙහි කොටස් නිවැරදිව පෙළගස්වා තිබේ ද?

(1) *K, F, H, G, J, I* (2) *K, F, G, H, J, I* (3) *K, F, I, G, H, J*
(4) *K, F, J, H, I, G* (5) *K, F, J, I, G, H*

**49.** පහත දැක්වෙන කවරක, සෑම් මාමා හා බාලම සොහොයුරා වන රණේ අතර සංවාදයෙහි කොටස් නිවැරදිව පෙළගස්වා තිබේ ද?

(1) *A, B, E, D, L* (2) *B, A, D, L, E* (3) *A, B, D, E, L*
(4) *D, A, E, L, B* (5) *D, A, L, E, B*

**50.** මුළු සංවාදයෙහි තර්කානුකූල අනුක්‍රමය පහත දැක්වෙන ඒවා අතුරෙන් කුමක් ද?

(1) *K, F, G, H, J, I, C, A, B, D, E, L* (2) *K, F, H, G, J, I, C, D, A, E, L, B*
(3) *K, F, I, G, H, J, C, D, A, E, L, B* (4) *K, F, J, H, I, G, C, D, A, L, E, B*
(5) *K, F, J, I, G, H, C, D, A, B, L, E*

PAST PAPERS WIKI

* * *